# එ ජා ප - ශ්‍රී ල නි ප ගිවිසුම හා රටේ ගමන්මග

එක්සත් ජාතික පක්‍ෂය හා ශ්‍රී ල නි පක්‍ෂය අතර පසුගියදා අත්සන් කෙරුණු අවබෝධතා ගිවිසුම යනු කලකට පෙර බ්‍රිතාන්‍යයන්ගේ අවශ්‍යතාවට ඇතිකරගනු ලැබූ ලියම් ෆොක්ස් ගිවිසුම ඉදිරියට ගෙනයෑමකි. මේ අවබෝධතා ගිවිසුම රනිල් වික්‍රමසිංහ මහතා හා ප්‍රභාකරන් අතර ඇති වූ ඊනියා සටන් විරාම ගිවිසුම මෙන් ම රටට අහිතකර ගිවිසුමකි. ජාතිකත්වයට පක්‍ෂපාතී කිහිපදෙනකු එ ජා පක්‍ෂයෙන් ශ්‍රී ල නි පක්‍ෂයට එක්වී නම් ඒ වෙනත් කරුණකි. එහෙත් මෙහි දී සිදුවූයේ එය නො වෙයි. එ ජා පක්‍ෂය රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් ම ශ්‍රී ල නි ප සමග ගිවිසුමකට එළඹී ඇත. අප මෙහි දී සලකා බැලිය යුත්තේ මේ පක්‍ෂ දෙක අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම කාගේ වුවමනාවක් සඳහා කුමක් සඳහා ඇතිකරගන්නා ලද්දක් ද යන්න ය. පසුගිය ජනාධිපතිවරණයේ දී එ ජා පක්‍ෂය හා ශ්‍රී ල නි  පක්‍ෂය ප්‍රමුඛ සන්ධානය සිටියේ දෙපැත්තක ය. සන්ධානය තරග වැදුනේ මහින්ද චින්තන ක්‍රියාත්මකකිරීමට ය. එ ජා ප තරගකෙළේ ජනතා න්‍යාය පත්‍රයක් වෙනුවෙනි. මහින්ද චින්තන ඒකීය රාජ්‍යයක් මත පදනම් වෙයි. ජනතා න්‍යාය පත්‍රය සන්ධීය රාජ්‍යයක්, බොහෝ විට සහසන්ධීය රාජ්‍යයක් වෙනුවෙන් කැපවෙයි. මේ ප්‍රතිපත්ති අතර ඇත්තේ යා දෙක නොරත රත තත්වයේ වෙනසකි. කිසි දිනෙක ඒ ප්‍රතිපත්තිවලට එකඟතාවකට පැමිණීමට නො හැකි ය. එසේ නම් ඒ පක්‍ෂ දෙක අතර අවබෝධතා ගිවිසුමක් ඇතිවූයේ කෙසේ දැයි කෙනකුට ඇසීමට හැකි ය. අවබෝධතා ගිවිසුමක් ඇතිවූවා නොව ඇතිකරන ලදී. ඒ ඇතිකරනු ලැබුයේ බටහිරයන් හා යම් ප්‍රමාණයකට ඉන්දියානුවන් විසිනි. මෙහි දී මූලික රාජ්‍ය වනුයේ බ්‍රිතානිය, ඇ එක්සත් ජනපදය හා ඉන්දියාව ය. මේ රටවල් එකක්වත් සිංහලයන්ට පක්‍ෂපාති රටවල් නො වෙයි. ඔවුන්ගේ අදහස සිංහලයන් මෙරට දෙමළ ජනයාට අසාධාරණයක් කර ඇති බව ය. ඔවුන් හා දෙමළ ජාතිවාදීන් කියන්නේ මෙරට සිංහලයන් තමන් ප්‍රධාන ජාතිය ලෙස සිතන බවත්, දෙමළ ජනයාට සමානත්වයෙන් නොසළකන බවත්,  සිංහලයන් පාර්ලිමේන්තුවේ හා කලින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ තම බහුතරය උපයෝගී කරගනිමින් දෙමළ අභිලාෂ මුදුන්පත්කරගැනීමට ඉඩ නොදුන් බවත් ය; එබැවින් ඊනියා සාම්ප්‍රදායික දෙමළ නිජභූමිවල, එනම් උතුරු හා නැගෙනහිර පළාත්වල, දෙමළ ජනයාට තම කටයුතු තමන්ට රිසිසේ කරගෙන යෑමට බලය විමධ්‍යගත කළයුතු බවත් ය.

මේ පූර්වායව හා නිගමන වලංගු නොවන බව පෙන්වාදීම අපහසු කරුණක් නො වේ. ලෝකයේ යම් රටක ජනවර්ග දෙකක් සමානවන්නේ නම් ඒ ඉතිහාසයක් නැති රටක ය. ලංකාව ඉතිහාසයක් නැති රටක් නො වෙයි. බ්‍රිතානිය ඉන්දියාව පමණක් නොව ඇ එ ජනපදය පවා ඉතිහාසයක් ඇති රටවල් ය. ඒ කිසිදු රටක ජනවර්ග සමාන නො වෙයි. බ්‍රිතානියේ මේ දිනවල මුස්ලිම් කාන්තාවන් තම සාම්ප්‍රදායික ඇඳුම ඇඳීම පිළිබඳ ආන්දෝලනයක් ඇති වී තිබේ. අගමැති බ්ලෙයාර් හා ජැක් ස්ට්‍රෝ වැනි ඇමතිවරු මුස්ලිම් කාන්තාවන්ට එවැනි නිදහසක් දීම ගැන විරුද්ධ වෙති. බ්‍රිතානියේ ද ඇ එ ජනපදයේ ද ප්‍රධාන සංස්කෘතිය ඉංගිරිසි ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය ය. ඔවුන්ට විශේෂිත වූ ප්‍රධාන සංස්කෘතියක් ඇත. එහෙත් ඔවුහු අපේ රටේ සියළු සංස්කෘතීන් සමාන විය යුතු යැයි කියති. බටහිර දියුණු යැයි කියන රටවල ඊනියා බහු සංස්කෘතික සංකල්පය කඩා වැටෙමින් පවතියි. ලංකාවේ දෙමළ හා සිංහල ඊනියා සමානත්වයක් ඇතිකළෝ බ්‍රිතානීහු ය. එකල වරප්‍රසාද ලත් පුරවැසියන් අතර සිංහල හා දෙමළ සංඛ්‍යාව සමානවිය. එයට හේතුව බ්‍රිතාන්‍යයන්ගේ සිංහල විරෝධී ප්‍රතිපත්තිය ය. දෙමළ ප්‍රභූන්ට අවශ්‍ය වූයේ ඒ සමාන තත්වය සැමදාමත් රැකගැනීම ය. ඒ සඳහා ඔවුන්ට බ්‍රිතාන්‍යයන්ගේ සහාය ලැබිණි. එහෙත් සර්වජන ඡන්දය සමග සිංහල මන්ත්‍රී සංඛ්‍යාව වැඩිවීමත් සමග ඇතිවූ තත්වයට මුහුණ දීමට සිංහල ක්‍රිස්තියානි ප්‍රභූන්ට හැකි වූ නමුත් දෙමළ ප්‍රභූන්ට නො හැකි විය. දෙමල ප්‍රභූහු මෙරට සිංහලත්වයට හිමිතැන ලබාදීමට විරුද්ධ වූහ.

මෙරට ප්‍රශ්නය අද පවත්නා තත්වයෙට වර්ධනය වූයේ බ්‍රිතානි ප්‍රතිපත්ති හේතුකොටගෙන ය. වෙරළ තීරයේ පමණක් දෙමළ ජනයා පදිංචි නැගෙනහිර පළාත දෙමළ පළාතක් බවට පත්කළෝ බ්‍රිතානීහු ය. නැගෙනහිර පළාතේ දෙමළ නිජබිමක සේයාවක් වත් නැත. ඒ බව විනාඩි දහයක් ඇතුළත පෙන්වා දිය හැකි ය. එහෙත් දේශපාලනය තීරණයවන්නේ බලය මත ය. අද දෙමළ ජාතිවාදය පිටුපස බ්‍රිතානීහු හා අනෙක් බොහෝ බටහිර ජාතීහු වෙති. මහින්ද රාජපක්‍ෂ මහතා බලයට පත්වූයේ ඒකීය රාජ්‍යය ආරක්‍ෂාකිරීමට ය. මෙරට සිංහලයන්ගෙන් අතිමහත් බහුතරය ඒ මහතාට ඡන්දය දුන්නේ ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමට ය. ඒ මහතා බලයට පත්කරනු ලැබුයේ ජාතික බලවේග විසිනි. එහි දී ජ වි පෙ හා ජා හෙ උරුමය විශේෂ කාර්යයක් ඉටුකෙළේ ය. සකලවිධ විජාතික බලවේග ඒ

© Prof. Nalin De Silva

මහතාට විරුද්ධව විජාතික බලවේගවල සෘජු නියෝජිතයා වූ එ ජා පක්ෂයට සහාය දුන්නේ ය. ජ වි පෙ රාජපක්ෂ මහතා බලයට පත්කිරීමෙහි ලා පැසසුම් කටයුතු කාර්යයක් ඉටුකළ ද ආණ්ඩුවට එකතු නො වී ය. ඒ ජ වි පෙ කළ වැරැද්දකි. යම් අයුරකින් ජ වි පෙ ආණ්ඩුවට එකතු වී සිටියේ නම් මේ වන විට නෝර්වේ නියෝජිතයන් ආපසු යැවීමටත් ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසිකරවීමටත් හැකියාව තිබුණි. ජ වි පෙ නැති ආණ්ඩුව දුර්වල විය. බටහිරයෝ මේ රික්තය දුටුවෝ ය. ආණ්ඩුවට එ ජා ප එකතුකිරීමට සැලැසුම් කෙරුනේ එවැනි පසුබිමක ය. ශ්‍රී ල නි ප හා එ ජා ප අතර ඊනියා අවබෝධයක් ඇතිකරවූයේ බටහිරයන් විසිනි. පසුගිය දිනවල රාජපක්ෂ මහතාගේ හා රනිල් වික්‍රමසිංහ මහතාගේ ලන්ඩන් සංචාරවල දී මේ ගිවිසුම අවසන්වරට සැකසුම් විණි යැයි සිතිය හැකි ය. ගිවිසුම ඊනියා ඉන්දියානු ආකෘතියේ බලය බෙදීමක් සඳහා ය. එය ඇතැම්විට සහසන්ධීය තත්වයකට යනු ඇත. අපට වැටහෙන ආකාරයට බටහිරයන් කොටි සංවිධානය පරාජයකිරීමට එ ජා ප - ශ්‍රී ල නි ප ආණ්ඩුවට සහාය දෙනු ඇත. එහෙත් ඒ සඳහා අප වන්දියක් ගෙවිය යුතු ය. ඒ වන්දිය අන්කිසිවක් නොව උතුරු හා නැගෙනහිර පළාත්වල සන්ධීය හෝ සහසන්ධීය හෝ ප්‍රාන්තයක් ඇතිකිරීම ය. මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය පසුගිය දා ඉතා වැදගත් තීන්දුවක් දෙමින් උතුරු හා නැගෙනහිර පළාත් සඳහා එක් පළාත් සභාවක් ඇතිකිරීම නීත්‍යානුකූල නො වේ යැයි ප්‍රකාශ කෙළේ ය. මේ තීන්දුව දේශපාලන වශයෙන් ගත්කල නොමනා එකක් යැයි ඇ එ ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම්වරයකු වූ බවුචර් මහතා ප්‍රකාශකර ඇත. මෙරට ශ්‍රේෂ්ඨධිකරණයේ තීන්දු ගැන කතාකිරීමට බවුචර් මහතාට හැකියාවක් ඇතැයි කීව ද ඒ තීන්දු වෙනස්කිරමේ දිශාවට බලපෑම් දැමීමට ඇති අයිතිය කුමක් ද? මෙරට දේශපාලන නායකයන් නිවටයන් වූ කල කළ හැක්කේ හැම එළුවාගේ ම නිකටපෑම ඉදිරියේ වැඳවැටීම පමණකි. බටහිරයන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට විරුද්ධවන්නේ ඔවුන්ගේ සන්ධීය හෝ සහසන්ධීය හෝ ප්‍රාන්තයට ඉඩ ලබාගැනීමට ය. බටහිරයන්ගේ අවශ්‍යතාව මත පිහිටුවන සන්ධීය හෝ සහසන්ධීය රාජ්‍යයේ උතුරු හා නැගෙනහිර පළාත් ඇතැම් විට ආනන්දසංගරී මහතාට හෝ වෙනත් අයකුට ලැබෙන අතර අනෙක් පළාත් රනිල් වික්‍රමසිංහ මහතාට ලැබෙනු ඇත. මහින්ද රාජපක්ෂ මහතා බලයේ තබාගැනීමට බටහිරයන්ට ඇති අවශ්‍යතාව කුමක් ද?

මහින්ද රාජපක්ෂ මහතාට විජාතික බලවේගවලින් එල්ලවන ප්‍රහාරය පරාජය කළ හැකි ද? තමන් (බෙන්තර) ගඟෙන් එහා නිසා මේ බලපෑම් පරාජය කළ හැකි යැයි ඒ මහතා විශ්වාස කරන්නේ නම් ඒ මුළාවකි. අද ඒ මහතාට සටන්කිරීමට සිදු වී ඇත්තේ මුහුදෙන් එහා බලවේග සමග ය. බ්‍රිතානීන් සටකපට රාජ්‍යතන්ත්‍රිකයන් බව අපි අත්දැකීමෙන් ම දනිමු. එහෙත් අපට මොවුන්ගේ සටකපට පරාජය කළ හැකි ය. අප සිටින්නේ සිංහලයන් ඩොයිලිට රැවටුණු යුගයේ නොවන බව අමතක නො කළ යුතු ය. සුද්දා හැරෙන්නේ කුමක් සඳහා දැයි දැන් අපට කීමට හැකි ය. සුද්දාට අවශ්‍ය වුවාට උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජාතිවාදයට පාවා දී සිංහලත්වයට හිමි තැන අභිමිකර ගැනීමට සිංහලයන් සූදානම් නැත. අපට කළ හැක්කේ මග පෙන්වීම පමණකි. ඒ සඳහා සංවිධාන ශක්තිය ඇත්තේ වෙනත් අයට ය. අද අවශ්‍ය වන්නේ ජාතික බලවේගවල පළල් ම සමගියකි. ශ්‍රී ල නි පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට ද සිදුවෙමින් පවතින්නේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් ඇත. ඔවුන්ගේ ද ආශිර්වාදය මුල දීත් සහභාගීත්වය පසුවත් එවැනි සමගියකට ලැබෙනු ඇත. බටහිර කපුවන් විසින් බලයෙන් ඇතිකරන ලද එ ජා ප - ශ්‍රී ල නි ප මගුලට ම එ පෙරමුණෙ දිනේෂ් ගුණවර්ධන මහතා සහභාගි වූයේ නැත. එය සුබ නිමිත්තකි. මේ මගුලෙන් රටට වන්නේ අයහපතකි. බටහිරයන්ගේ අවශ්‍යතාවට සන්ධීය හෝ සහසන්ධීය හෝ නමැති අවජාතක දරුවා බිහිකිරීම මේ නීත්‍යානුකූල ලෙස පෙනෙන එහෙත් ජනතා තීන්දුවට පටහැණි අනියම් මගුලේ අරමුණ ය. එ ජා ප මහින්ද චින්තන වෙතට ගමන්කරනු වෙනුවට ශ්‍රී ල නි පක්ෂයට සිදුවන්නේ සන්ධීය රාජ්‍යය වෙතට දණගෑමට ය. එහෙත් ඒ එසේ සිදුවිය යුතු නො වේ. ජාතික බලවේගවල පළල් ම සමගියකින් විජාතික බලවේගවල සැලසුම් පරාජය කළ හැකි ය. අපට කපුවන් කපෝති කළ හැකි ය. එහෙත් එහි දී ස්වයං අධිතක්සේරුවලට හෝ 1987- 89 ක්‍රියාමාර්ගවලට හෝ නො යායුතු ය. අවශ්‍ය වන්නේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී මගේ සංවිධානයකිරීම ය. බටහිරයන් බලා සිටින්නේ අප පොට වරද්දා ගන්නා තෙක් ය. බටහිරයන් විසින් ජාතික ව්‍යාපාරයට රිංගවනු ලැබ ඇති අය ජාතික ව්‍යාපාරයට වැරදි උපදෙස් දී ඒ අතිධාවනකාරී මාවතකට යොමුකර අවසානයේ දී ඒ වැනසීමට බලාපොරොත්තුවෙන් සිටිති. අප ඔවුන්ගේ බළල් අත් බවට පත්විය නො යුතු ය. මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්වී අවුරුද්දක් ගතවීමට කලින් රටේ ගමන්මග සම්පූර්ණයෙන් ම ආපස්සට හැරවීමට බටහිරයන් සමත් වී ඇත. අප කල්පනාවෙන් හා ඉවසීමෙන් වැඩකළහොත් ජාතික ව්‍යාපාරයට නැවතත් රටේ ගමන්මග තීරණයකිරීමට හැකිවනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva